පොදු චක්‍රලේඛ 01/2025-A

මගේ අංකය- DCDSP/02/22/04
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,ගාල්ල.
2025.05. 21

සහකාර කොමසාරිස් (ප්‍රධාන කාර්යාලය,ගාල්ල/මාතර/හම්බන්තොට) ,
දිස්ත්‍රික් නිලධාරීන් (ප්‍රධාන කාර්යාලය,ගාල්ල/මාතර/හම්බන්තොට) ,
මූලස්ථාන සංවර්ධන නිලධාරීන්(ප්‍රධාන කාර්යාලය,ගාල්ල/මාතර/හම්බන්තොට) ,
සියළුම සමුපකාර සංවර්ධන නිලධාරීන්

**වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සම්බන්ධවයි.**

දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 66.(1) වගන්තිය අනුව සෑම ලියාපදිංචි සමුපකාර සමිතියකම සභාපතිවරයා විසින් සහ කාරක සභාවේ සෑම සාමාජිකයෙකු විසින්ම, ඔහු හෝ ඇය සභාපති ධූරයට/ උප සභාපති ධූරයට හෝ කාරක සභික ධූරයට තෝරාපත් කර ගනු ලැබූ හෝ පත්කරනු ලැබූ දින සිට මාස 03 ක් ඇතුළත හා ඉන් පසුව ධූරය දරන තාක් කල් වාර්ෂිකව, ඒ වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පැවති පරිදි ඔහුගේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳවද, ඔහුගේ කාලත්‍රයාගේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳවද, ඔහුගේ එක් එක් දරුවාගේ සියලු වත්කම් හා බැරකම් පිළිබඳවද නියමිත ආකෘතියෙහි වූ වත්කම් හා බැරකම් ප්‍රකාශයක්, රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කල යුතුය. (මීට අදාල උපදෙස් මාගේ පොදු චක්‍රලේඛ 01/2025 මඟින් ගරු සභාපති ඇතුළු සියළුම කාරක සභිකයින් වෙත ලබාදී ඇත.)

02. එසේ සමුපකාර සමිතිවල සභාපතිවරුන් උප සභාපතිවරුන් හා කාරක සභිකයින් විසින් ඉදිරිපත් කරනු ලබන වත්කම් බැරකම් ප්‍රකාශ සම්බන්ධයෙන් 2025.05.15 දින සිට ඔබ විසින් පහත උපදෙස් අනුව කටයුතු කල යුතුය.

03. ඉදිරිපත් වන වත්කම් හා බැරකම් ප්‍රකාශ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සුදුසු මාණ්ඩලික නිලධාරියෙකු හා විෂය නිලධාරියෙකු පත් කළ යුතු අතර එම නිලධාරීන් විසින් මෙම ප්‍රකාශ කාර්යාලීය තැපැල මඟින් භාර ගැනීම, අදාල පොත්වල සටහන් කිරීම, ගොනු කිරීම හා ආරක්ෂිතව තැන්පත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වන හා අවශ්‍ය විය හැකි සියළු කටයුතු සිදු කල යුතු අතර එහිදී පහත පරිදි කටයුතු කළ යුතුය.

- 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ විධිවිධාන අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ ලියාපදිංචි තැපැල් මඟින් ඔබ කාර්යාලය වෙත යොමු කල යුතු බැවින් කිසි විටක අතින් ගෙනවිත් දෙනු ලබන මෙවැනි ප්‍රකාශ භාර නොගත යුතුය.
- මෙම ප්‍රකාශ තැපෑලෙන් ලද විට දෙවෙනි කවරය නොකඩා ලියාපදිංචි ලිපි තැපැල් පොතේ සටහන් කර විෂය භාර නිලධාරී වෙත ලබා දිය යුතු බවට තැපැල් විෂය නිලධාරී හා සියලුම කාර්යාල කාර්ය සහයක නිලධාරීන් දැනුවත් කළ යුතුය.
- මෙවැනි ප්‍රකාශයක් ලද විට ඒ බව සටහන් කිරීම සඳහා විෂය නිලධාරී විසින් වෙනම පොතක් නඩත්තු කළ යුතු අතර එහි පහත සඳහන් තොරතුරු ඇතුළත් කිරීම සඳහා තීරු තිබිය යුතුය.

| අනු අංකය | සමිතියේ නම | ප්‍රකාශය ඉදිරිපත් කරන්නාගේ නම | ප්‍රකාශය ඉදිරිපත් කරන්නාගේ තනතුර හා ප්‍රකාශයට අදාල කාල සීමාව | ප්‍රකාශය කාර්යාලයට ලැබුණු දිනය | විෂය නිලධාරී අත්සන | මාණ්ඩලික නිලධාරී අත්සන | ගොනු අංකය (ලැබෙන අනුපිළිවෙලින් වර්ෂය සමග ගොනු අංක යෙදිය යුතුය. උදා -2025/01) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |

- ලැබෙන ප්‍රකාශ තැන්පත් කිරීම සඳහා සුදුසු ආරක්ෂිත ස්ථානයක් පවත්වාගෙන යායුතු අතර එහි වෙනත් ලේඛණ/ ගොනු තැන්පත් නොකළ යුතුය.
- තවද මෙම ප්‍රකාශ ගොනු අංක පිළිවෙලින් අදාල ආරක්ෂිත ස්ථානයේ තැන්පත් කළ යුතු අතර පහසුවෙන් තෝරා ගත හැකි වන පරිදි පටුනක් යෙදිය යුතුය.
- එහි යතුරු කාර්යාලීය සේප්පුවේ තිබිය යුතු අතර අවශ්‍යා අවස්ථාවන්හිදි අදාල විෂය නිලධාරී ලබා ගෙන නැවත එහි තැබිය යුතුය.
- මෙම ප්‍රකාශ විවෘත කිරීම බලයලත් නිසි නිලධාරියෙකු හෝ ආයතනයක් විසින් ඉල්ලුම් කරන ලද විටකදී පමණක් සිදු කල යුතු අතර ඒ සඳහා මා වෙතින් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

03. ඉහත පරිදි කටයුතු කිරීම පැහැර හරින තැනැත්තේකුගේ ධූරය එම කරුණින්ම අහෝසි වන බවද, එසේ ධූරය අහෝසි වන දින සිට එම ධූරයට අදාල ඉතිරි ධූර කාලය තෙක් එම සමිතියේ කිසිදු ධූරයකට පත් කිරීමට ඔහු හෝ ඇය නුසුදුස්සෙකු වන බවද, ඉදිරිපත් කරනු ලබන වත්කම් හා බැරකම් ප්‍රකාශයක් අසත්‍ය බවට තහවුරු වුවහොත් එදින සිට වර්ෂ හතක් ගතවන තුරු ඔහු හෝ ඇය කිසිදු සමුපකාර සමිතියක කිසිම ධූරයක් දැරීමට නුසුදුස්සෙකු වන බවද සියළුම සමුපකාර සමිති දැනුවත් කිරීමට කටයුතු කල යුතුය.

05. මෙහි කාරක සභිකයා/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා යන්න දකුණු පළාතේ පළාත් සභාවේ 2019 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 76 වගන්තියේ සඳහන් කාරක සභාව යන්නේ අර්ථ නිරූපනයට අදාල වේ.

චන්ද්‍රිකා වික්‍රමසිංහ,
සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත

සී. වික්‍රමසිංහ
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (ද.ප.)
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

පිටපත්

1. සියළුම ප්‍රාදේශීයසමූපකාර සංවර්ධන නිලධාරීන් - කාරු.දැ.පි. හා සමු. සමිති දැනුවත් කිරීම සඳහා